# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1794/8 - 2013 ජනවාරි මස 21 වැනි සඳුදා - 2013.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන කිරීමේ සේවා ප්‍රඥප්තියට පනවන ලද නියෝග සංශෝධනය කිරීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, පළාත් පාලන මිනිස්බල අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වානිජ, ආහාර සැපයුම් හා බෙදා හැරීම් කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මම 1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව පහත සඳහන් ගාස්තු අයකිරීම් සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| අනු. අංකය | විස්තරය | පෙර පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|---|
| 01 | හිමිකරුගේ ඉල්ලීම පරිදි මගී ප්‍රවාහන සේවා අවසරපත්‍ර අවලංගු කිරීම<br>i. අයදුම් පත්‍රය<br>ii. අවසරපත්‍ර අවලංගු කිරීම | <br><br>රු. 250.00<br>රු. 2,500.00 | <br><br>රු. 1,000.00<br>රු. 5,000.00 |
| 02 | විශේෂ චාරිකා බලපත්‍ර ගාස්තු | පළමු දිනට රු. 200.00<br>ඊට අමතරව වැඩිවන එක් දිනකට<br>රු. 100.00 බැගින් අයකරනු ලැබේ. | සෑම දිනකටම රු. 200.00<br>බැගින් අය කිරීම |
| 03 | වාර්ෂික බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තුව<br>i. සාමාන්‍ය සේවා බස් රථ<br>ii. සුඛෝපභෝගී සේවා බස් රථ | <br>රු. 3,000.00<br>රු. 5,000.00 | <br>රු. 4,500.00<br>රු. 7,500.00 |
| 04 | මාසික ධාවන සටහන් පත්‍ර ප්‍රමාද ගාස්තු<br>i. ධාවන සටහන් පත්‍ර සඳහා<br>ii. පිවිසුම් පත්‍ර සඳහා | <br>ප්‍රමාද වන සතියකට<br>රු. 25.00 බැගින් වන සේ<br>මසකට රු. 100.00ක් | <br>සතියකට<br>රු. 100.00 බැගින් වන සේ<br>මසකට රු. 400.00ක් |

සරත් ඒකනායක,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ
හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදා හැරීම් කටයුතු
සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය,
මධ්‍යම පළාත.

02-214

1A - PG 001529— 340 (2013/01)

## මධ්‍යම පළාතේ පළාත් සභාව

### මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් කරන ලද නිවේදනයයි

**මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමුපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදා හැරීමේ කටයුතු, ආයෝජන සම්බන්ධිකරණ අමාත්‍ය සරත් ඒකනායක වන මා වෙත මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ දෙවන වගන්තියේ දෙවන සහ හතරවන උප වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව පහත අංක I වැනි තීරුවේ සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III වැනි තීරුවේ සඳහන් බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| එස්. එම්. සී. ගුණරත්න | 2012.10.17 | මධ්‍යම පළාත් සභාවේ 1990 සමුපකාර සමිති ප්‍රඥප්තියේ 3, 5, 6, 7, 8, 9, 33, 43, 43(අ), 44, 45, 46, 48, 52, 53, 54, 58 (2අ, 3, 4, 5 උප වගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69, 74 සහ 75, රීති මාලාවේ 4, 11, 15, 16 (ii), 18. 19, 20, 27, 32, 33, 35,37, 39, 40, 41, 42, 43, 48, 49, (12 ආ, ඇ, ඈ, ඉ උප වගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු සියළු බලතල |

සරත් ඒකනායක,
මධ්‍ය පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්,
සමුපකාර සංවර්ධන, ආහාර සැපයුම් හා බෙදා හැරීමේ කටයුතු
සහ ආයෝජන සම්බන්ධීකරණ අමාත්‍ය.

02-215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.